**උඩපළාත ප්‍රාදේශීය සභාව.**

**මහනුවර දිස්ත්‍රික්කය.**

**-------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

**සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන2017 මාර්තු 29 දින ද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 06 දින ද විගණනයට ඉදිරිපත් කර තිබුණි.**

**1.2 තත්ත්වාගණනය කළ මතය**

**මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට උඩපළාත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.**

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම.**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

**පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.**

**(අ) කල් බදු ක්‍රමය යටතේ පෑලියගොඩ ලංකා බැංකුව සමග ගිවිසුම්ගතව පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් මිල දී ගෙන සභාවට ලබා දී තිබූ රු.6,390,000 ක් වටිනා PF – 7352 අංක දරන ඩබල් කැබ් රථයේ වටිනාකම සහ සභාවට අයිතිය පවරා ගෙන නොතිබූ MO – 4991 හා MM – 9754 අංක දරන යතුරු පැදි 2 හි වටිනාකම ගිණුම්කරණ සටහන් මගින් හෙළිදරව් කර නොතිබුණි.**

**(ආ) සභාව සතු RW – 9106 අංක දරන රු.150,000 ක් වටිනා ට්‍රේලරය ගිණුම්ගත කර නොතිබුණි.**

**1.3.2 නොසැසඳුණු පාලන ගිණුම්**

**මූල්‍ය ප්‍රකාශන අනුව ගිණුම් විෂයයන් 2 ක ශේෂය, උපයෝගී ලේඛන සමග සැසඳීමේ දී, රු.97,434,636 ක නොසැසඳීමක් අනාවරණය විය.**

**1.3.3** ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) ලැබිය යුතු ගිණුම්

**2016** දෙසැම්බර් **31** දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ **7** ක එකතු වටිනාකම රු.**15,814,754** ක් වූ අතර, එයින් අවුරුදු**05** ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි එකතුව රු.**4,418,928** ක් වී තිබුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්

**2016** දෙසැම්බර් **31** දිනට එකතුව රු.**13,224,363** ක් වූ ගෙවිය යුතු ගිණුම් ශේෂ **2** ක වටිනාකමින් අවුරුදු **5** ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි එකතුව රු.**956,809** ක් විය.

**1.3.4** විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම

ගිණුම් විෂයයන් **2** කට අදාළ අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරිම හේතුවෙන් එකතුව රු.**23,497,881** ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

**1.3.5** නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) **1987** අංක **15** දරන ප්‍රාදේශීය සභා පනත | |
| **49**(අ) වගන්තිය | ප්‍රාදේශීය සභාවට අයත් මාර්ගයක මධ්‍යයේ සිට අඩි **25** ක් වූ සීමාව තුළ යම් ගොඩනැගිල්ලක් ඉදි කිරීම නීත්‍යයානුකූල නොවන බව සඳහන්ව ඇතත්, එම නියමයෙන් බැහැරව පුස්සැල්ලාව උප කාර්යාලය අසළ පදිංචිකරුවෙකු විසින් ඉදිරිපත් කරන ලද ගොඩනැගිලි අයදුම්පත වෙනුවෙන් වූ ඉහත සීමාව අඩි **16** ක්ව පැවතිය දී සභාව විසින් ගොඩනැගිලි සැලසුම් අනුමත කර තිබූ අතර, ස්ථානීය පරීක්ෂාවේ දී එම ගොඩනැගිල්ල මාර්ගයට මායිම්ව (මායිමේ සිට අඩි **2** කට නොඅඩු) ඉදි කරමින් තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී | |

| | |
|---|---|
| ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>---------------------------------------------<br>**මු.රෙ.571(3)** | තැන්පතු මුදල්, ඉකුත් වූ තැන්පතු වශයෙන් සලකනු ලැබීම සඳහා ඉඩ නොතබා, අවස්ථාවෝචිත පරිදි අදාළ ගිණුමට හෝ රජයේ ආදායමට බැර කිරීම නැතහොත්, හැකි ඉක්මනින් ආපසු ගෙවිය යුතු වුවත්, **2011** සිට **2015** දක්වා කාල පරිච්ඡේදයට අදාළ රු.**3,293,691** ක් වටිනා ඉකුත් තැන්පතු අයිතම **126** ක් සම්බන්ධව කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය<br>--------------------------------------------<br>**xix** වැනි පරිච්ඡේදයේ **7.1** වගන්තිය | රජයේ සේවයේ යෙදී සිටින නිලධාරියෙකු විශ්‍රාම ලබන අවස්ථාවේ දී රජයේ නිවාසයක පදිංචිව සිටින්නේ නම්, විශ්‍රාම ලැබූ විට නිවාසය භාර දිය යුතු වුවත්, එසේ කටයුතු නොකර නිවාස තුළ රැදී සිටින විශ්‍රාමික නිලධාරීන් තිදෙනෙකු සම්බන්ධව කටයුතු කර සන්තකය පවරා ගෙන නොතිබුණි. |

**(ඇ)** ගැසට් නිවේදන

**------------------**

| | | |
|---|---|---|
| | **1996** අගෝස්තු **06** දිනැති අංක **935/6** දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය. | අනු බෙදුම් කර ඉඩම් විකිණීමේ දී **1999** සිට **2012** කාල පරිච්ඡේදය තුළ පොදු පහසුකම් සඳහා සභාවට වෙන් කළ රු.**27,805,000** ක් වටිනා බිම් කොටස් **13** ක් සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විටත් වැට මායිම් සකස් කර අනු බෙදුම්වල පදිංචි ජනතාවගේ පොදු පහසුකම් සඳහා යොදා ගැනීමකින් තොරව නිෂ්කාර්යව පැවතුණි. |

**(ඉ)** චක්‍රලේඛ.

**------------**

| | | |
|---|---|---|
| **i** | **2001** අගෝස්තු **07** දිනැති අංක **15/2001** දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ **2** වගන්තිය | නිලධාරීන් සහ සේවකයින් **47** ක් සේවයේ නිරත වී ඇති ප්‍රාදේශීය සභාවේ **2016** දෙසැම්බර් **31** දින වන විටත් වේලා සටහන් යන්ත්‍රයක් භාවිතා කර නොතිබුණි. |
| **ii** | **2016** මාර්තු **17** දිනැති අංක **2016/3** දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ **10** ඡේදය | කඩ කාමර අතුරු බදු දීම සම්පූර්ණයෙන් තහනම් කර, අතුරු බදු දී ඇති අවස්ථාවක දී බදු ගිවිසුම අවලංගු කළ යුතු වුවත්, පොදු වෙළඳ පොළෙහි එක් කඩ කාමරයක් හා සති පොළෙහි බිම් මහළෙහි කඩ කාමර **5** ක් අතුරු බදු දී ඇති බවක් **2017** ජනවාරි **19** දින සිදු කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**-----------------------**

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

**---------------**

**ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු.38,088,171 ක් වූ අතර,ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු.29,594,136 ක් වූයෙන්, මූල්‍ය ප්‍රතිඵලවල රු.8,494,035 ක වර්ධනයක් නිරීක්ෂණය විය.**

**2.2.1** **වරිපනම්**

**----------**

**පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.**

**(අ)** **2016 ජනවාරි 01 දිනට හිග හිටි වරිපනම් ශේෂය රු.2,250,053 ක් වූ අතර, 2016 වර්ෂයේ බිල් කිරීම් රු.1,369,808 ක් විය. මින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට අය කර තිබුණේ පිළිවෙළින් රු.597,887 ක් හා රු.816,862 ක් පමණි. මෙය ප්‍රතිශතයක් ලෙස සියයට 27 ක් හා සියයට 60 ක් විය. සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට හිග ශේෂය රු.2,205,112 ක් විය. මේ අනුව, හිඟ ආදායම් රැස් කිරිම දුර්වල මට්ටමක පැවතුණි.**

**(ආ)** **සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රජයේ ආයතන 23 කින් අය විය යුතු වර්ෂ 2 ක කාලයක සිට පැවත එන රු.110,991 ක හිග හිටි වරිපනම් ශේෂයක් පැවතුණි.**

**(ඇ)** **2016 දෙසැම්බර් 31 දිනට හිග වරිපනම් බදු ශේෂය තුළ වර්ෂ 5 ට වැඩි කාලයක් තුළ වරිපනම් බදු ගෙවීම පැහැර හැර තිබූ පුද්ගලයින්ගෙන් රු.1,443,378 ක මුදලක් සභාවට අය විය යුතුව තිබුණි. මේ සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය පරිදි කටයුතු කර නොතිබුණි.**

**(ඇ)** **වසර 5 කට වරක් නව තක්සේරුවක් කර, බදු අය කළ යුතු වුවත්, සභාව විසින් 2005 වර්ෂයෙන් පසු නව තක්සේරුවක් සිදු නොකර, පැරණි තක්සේරුව පදනම් කර ගනිමින් 2016 වර්ෂයට වරිපනම් බදු බිල් කර තිබුණි.**

**2.2.2** බදු කුළි.

----------

**(අ)** ඉඩම් බදු

---------

**2016** දෙසැම්බර් **31** දිනට හිඟ හිටි ඉඩම් බදු ශේෂය තුළ වර්ෂ **5** ට වැඩි කාලයක සිට අය විය යුතු රු.**24,048** ක ශේෂයක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ආ)** හිඟ කඩ කාමර කුළී

----------------------

මේ සම්බන්ධව පහත නිරීක්ෂණයන් කෙරේ.

**(i)** **2012** වර්ෂයට පෙර සිට ඉදිරියට එමින් පවතින පුස්සැල්ලාව නගරයේ කඩ කාමර හිමියන් **63** දෙනෙකුගෙන් අය විය යුතු රු.**386,658** ක් වූ හිඟ කඩ කුළිය හා **2010** වර්ෂයට පෙර සිට ඉදිරියට එන රු.**39,837** ක් වූ දොළුව සති පොළේ සහ දොළුව පොදු වෙළඳ පොළේ හිඟ කඩ කාමර කුළිය හඳුනා ගෙන අය කිරීමට කටයුතු කර නොතිබුණි.

**(ii)** දොළුව කඩ කාමර බදු දීමේ බදු ගිවිසුමේ **5** වගන්තිය පරිදි මාසික බදු මුදල ප්‍රමාද වන තෙවන මාසයේ දී ගිවිසුම අහෝසි වන බව දක්වා ඇතත්, කඩ කාමර **7** ක් වෙනුවෙන් අය විය යුතු රු.**25,200** ක් මාස **03 – 10** ත් අතර කාලයක් හිඟ හිට තිබුණි.

**(iii)** සමාලෝචිත වර්ෂය තුළදී දොළුව සති පොළෙහි බිම් මහල හා ඉහළ මහල කඩ කාමර **20** ක් ටෙන්ඩර් කිරීමකින් තොරව බාහිර පාර්ශවයන් වෙත බදු පදනම මත ලබා දී තිබුණු අතර, පාර දෙක නගරයේ අලුත්වැඩියා කළ පොදු වෙළඳ පොළෙහි කඩ කාමර **2** ක් ටෙන්ඩර් කිරීමකින් තොරව බදු දී තිබුණි.

**2.2.3** වෙනත් ආදායම්

----------------

ජල ගාස්තු.

---------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

**(අ)** ස්වාභාවික ජල මූලාශ්‍රවලින් ජලය ලබා දීමේ දී සභාව විසින් මාසිකව ගෘහ ඒකකයකින් රු.**75** ක ස්ථාවර මුදලක් අය කරනු ලබන අතර, **2016** දෙසැම්බර් **31** දින වන විට හිඟ හිටි ජල ගාස්තුව රු.**1,973,728** ක් වී තිබුණි.මෙම ජල ගාස්තු හිඟය තුළ දැල්පිටිය ප්‍රදේශයේ සහ දොළුව ප්‍රදේශය තුළ අක්‍රීයව පවතින ජල මූලාශ්‍රවලට අදාළව රු.**847,667** ක වටිනාකමක් ද ඇතුළත්ව තිබුණි.

(ආ) පුස්සැල්ලාව බල ප්‍රදේශයේ **2005** වර්ෂයේ සිට පැවත එන රු.**82,145** ක ජල ගාස්තු හිඟය අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.4** උසාවි දඩ හා මුද්දර ගාස්තු.

--------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් **2016** දෙසැම්බර් **31** දිනට උසාවි දඩ රු.**2,855,597** ක් හා මුද්දර ගාස්තු රු.**20,556,558** ක් අය වියයුතුව තිබුණි.

**3.** මෙහෙයුම් සමාලෝචනය

----------------------------

**3.1** කාර්යසාධනය

------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සභා අරමුදල් යටතේ සමාලෝචිත වර්ෂයේ දී හඳුනා ගෙන ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ රු.**1,042,000** ක් වටිනා සංවර්ධන යෝජනා **8** ක් අනුමැතිය සඳහා පළාත් පාලන කොමසාරිස්වරයා වෙත වර්ෂය ආරම්භ වී මාස **7** ක් ගත වීමෙන් පසුව **2016** අගෝස්තු **12** දින ඉදිරිපත් කර තිබූ අතර, එකී යෝජනා **8** සැප්තැම්බර් **24** දින ප්‍රධාන අමාත්‍යවරයා විසින් අනුමත කර එවා තිබුණි. **2016** දෙසැම්බර් **31** දින වන විට මින් කර්මාන්ත **3** ක වැඩ අවසන්ව තිබූ අතර, ඉතිරි කර්මාන්ත **5** හි වැඩ සමාලෝචිත වර්ෂය තුළ අවසන් කිරිමට නොහැකි වී තිබුණි. මේ හේතුවෙන් වර්ෂය තුළ සභා බල ප්‍රදේශයට ඉටු කළ යුතු සංවර්ධන කටයුතු ප්‍රමාණවත්ව ඉටු කිරීමට නොහැකි වී තිබුණි.

(ආ) සභාව විසින් එක් එක් වර්ෂයන්ට අදාළ ස්වයං උත්පාදන ආදායමෙන් සියයට **30** කට වැඩි ප්‍රතිශතයක් පනතේ අරමුණු ඉටු වන ආකාරයෙන් සංවර්ධන කාර්යයන් සඳහා යෙදවිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට රු.**77,989,801** ක පුනරාවර්තන ආදායමක් උපයා ගෙන තිබියදී ඉන් සංවර්ධන කටයුතු සඳහා යොදවා තිබුණේ රු.**1,657,283** ක් වූ සියයට **2** ක් තරම් වූ අඩු ප්‍රතිශතයකි.

(ඇ) **1987** අංක **15** දරන ප්‍රාදේශීය සභා පනතේ **3** වගන්තිය ප්‍රකාරව එම ප්‍රදේශය ඇතුළත ජනතාවගේ සුඛ විහරණය, පහසුව සහ සුභ සාධනය සහ සියලු පහසුකම් ආරක්ෂා කිරීමට සහ ප්‍රවර්ධනය කිරීම ප්‍රාදේශීය සභාවේ කර්තව්‍යක් ලෙස දක්වා ඇතත්, ප්‍රජා සංවර්ධන වැඩසටහන් සහ ප්‍රජා මූල සංවිධාන පිහිටුවීම සඳහා අයවැයෙන් වෙන් කර තිබූ පිළිවෙළින් රු.**80,000** ක් සහ

රු.30,000 ක් වශයෙන් එකතුව රු.110,000 ක් වූ ප්‍රතිපාදනවලින් ප්‍රජා සංවර්ධන වැඩසටහන වෙනුවෙන් රු.1,525 ක් පමණක් වැය කර තිබුණි.

**3.2** කළමනාකරණ අකාර්යක්ෂමතා
-----------------------------------
පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) 2014 වර්ෂයේ දී සිදු කර ඇති වත්කම් සමීක්ෂණයෙන් හඳුනා ගත් රු.250,402,460 ක් වටිනා වත්කම් 2016 දෙසැම්බර් 31 දින වන විටත් නිවැරදිව ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණි.

(ආ) සභාවේ වත්කම් ලේඛනයේ සටහන්ව ඇති රු.67,000 ක් වටිනා ඉඩම් 4 ක් හඳුනා ගත නොහැකි තත්ත්වයේ පවතින බව සඳහන්ව ඇතත්, ඊට අදාළ හේතු පැහැදිලි කර නොතිබුණි.

(ඇ) 2014 වර්ෂයේ සිදු කර ඇති වත්කම් සමීක්ෂණයෙන් අලුතින් ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් විය යුතු වත්කම් 39 ක් හඳුනා ගෙන ඇතත්, සභාව විසින් මෙම වත්කම් අදාළ ලේඛනයට ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ප්‍රාදේශීය සභාව දේපළක් ලෙස පරිහරණය කරනු ලබන ගොඩනැගිලි සහිත රු.14,300,000 ක් වටිනා ඉඩම් 7 ක සන්තකය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) 2016 දෙසැම්බර් 31 දිනට සභාවේ විවිධ තනතුරුවල පුරප්පාඩු 26 ක් සහ අතිරික්තතා 2 ක් පැවතුණි.

(ඊ) සභාව සතු සුසාන භූමි 53 ක් හා ක්‍රීඩා පිටි 3 ක පිහිටි ඉඩම්වල අයිතිය සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දින ස්ථාන මාරු වී ගිය නිලධාරින් 6 කගෙන් අය විය යුතු රු.794,835 ක ණය ශේෂ, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.3** මෙහෙයුම් අකාර්යක්ෂමතා
------------------------------
පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) **2012** සිට **2015** දක්වා වූ කාල පරිච්ඡේදය තුළ ගොඩනැගිලි අයදුම්පත් **621** ක් අනුමත කර ඇතත්, මෙම කාල පරාසය තුළ අනුකූලතා සහතික නිකුත් කර තිබුණේ **25** ක් තරම් අඩු ප්‍රමාණයකට වූ බැවින්, එය සියයට **4** ක් තරම් වූ දුර්වල මට්ටමක පැවතුණි.

(ආ) **2002** වර්ෂයේ ඉදි කර ඇති දොළුව පොදු වෙළඳ පොළේ ඉහළ මාලයේ කඩ කාමර **13** ක් භාවිතයට ගැනීමට හැකි වන පරිදි සකස් කර නොතිබුණු අතර, ඉදි කළ වර්ෂයේ සිට **2016** දෙසැම්බර් **31** දින දක්වාම නඩත්තු කිරීමකින් තොරව විනාශ වීමට ඉඩ හැර තිබුණි. එසේම, මෙම ස්ථානය විවිධ අපචාර ක්‍රියා සඳහා යොදා ගැනීමට ඇති ඉඩකඩ බැහැර කළ නොහැකි විය.

(ඇ) **1987** අංක **15** දරන ප්‍රාදේශීය සභා පනතේ **78(1)** ප්‍රකාරව සභාව පොදු මහජන සෞඛ්‍ය අධිකාරිය විය යුතු බව සඳහන්ව ඇතත්, සභාව සතුව දැල්පිටිය හා දොළුව ඒකක **2** හි පවතින ජල යෝජනා ක්‍රම **21** ක ජලය පිරිසිදු කිරීමකින් තොරව මහජනයා වෙත ලබා දෙන බව අනාවරණය විය.

(ඇ) ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන වෙනුවෙන් **2015** වර්ෂයේ සැප්තැම්බර් **11** දින හා දෙසැම්බර් **30** දින ලැබී තිබුණු රු.**1,257,785** ක මුදල අදාළ ව්‍යාපෘතීන් වෙනුවෙන් යෙදවීමට කටයුතු නොකර තැන්පතු ගිණුමේ රඳවා ගෙන තිබුණි.

**3.4** නිෂ්ක්‍රීය/ ඌන උපයෝජිත වත්කම්.

-------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) රු.**102,999** ක් වටිනා අත් ට්‍රැක්ටරය සහ වටිනාකම හඳුනා ගත නොහැකි කැබ් රථයක් වසර **1** සිට වසර **24** දක්වා කාලයක සිට නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවතුණි.

(ආ) එක් එක් සභාවල වැඩ ඒකකයන් ස්ථාපිත කිරීම සඳහා පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය මගින් **2014** දෙසැම්බර් **16** දින රු.**596,990** ක් වටිනා ගැල්වනයිස් බට **616** ක් සභාවට ලබා දී ඇතත්, අදාළ කාර්යයට යොදවා ගැනීමකින් තොරව පුස්සැල්ලාව නගර ශාලාවේ නිෂ්කාර්යයව ගොඩ ගසා තිබුණි.

**3.5** හඳුනාගත් අලාභ.

---------------------

රු.**37,796** ක් වටිනා ගැල්වනයිස් බට **39** ක ඌනතාවයක් පවතින බව කරන ලද භෞතික පරීක්ෂණයේ දී නිරීක්ෂණය විය.

**3.6 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය.**

**-----------------------------------**

**සභාව මගින් නගර හා ප්‍රදේශ මට්ටමින් ස්ථාන 8 කින් දෛනිකව කසළ ටොන් 3 ½ ක් පමණ එකතු කරන අතර, ඉන් පුස්සැල්ලාව හා පාර දෙක ප්‍රදේශවල කසළ හැර, මාවතුර, දොළුව, ඉලංගවත්ත, එගොඩකළුගමුව, පුපුරැස්ස, පන්විලතැන්න යන ප්‍රදේශවලින් සතියකට එකතු වන කසළ ටොන් 12 කට ආසන්න ප්‍රමාණයක් කළමනාකරණයකින් තොරව ඒ ඒ ප්‍රදේශවල අක්‍රමවත්ව බැහැර කර තිබුණි. එසේම, පුස්සැල්ලාව නගරයේ කසළ පුස්සැල්ලාව නගර ශාලාව අසළ කසළ රැස් කිරීමේ ස්ථානයේ අපිළිවෙළට දමා තිබීමෙන්, එම ප්‍රදේශය අවට පරිසරය දූෂණය වී ප්‍රදේශය අප්‍රසන්න තත්ත්වයකට පත් වී තිබුණි.**

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**---------------------------------------**

**4.1 අයවැය පාලනය.**

**--------------------**

**සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙළ කර තිබුණු අයවැය ලේඛනයට අනුව, ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමග සැසඳීමේ දී ආදායම් විෂයයන් 2 ක සියයට 69 සිට සියයට 90 ඉක්මවා ද, වියදම් විෂයයන් 9 ක සියයට 25 සිට සියයට 87 දක්වා ද විචලනයන් නිරීක්ෂණය වූ අතර, අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.**

**4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැළැස්ම.**

**--------------------------------**

**සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.**

**4.3 අභ්‍යන්තර විගණනය.**

**---------------------------**

**මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තා පිටපත් විගණකාධිපති වෙත එවිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාළ අභ්‍යන්තර විගණන වාර්තා විගණනය වෙත එවා නොතිබුණි.**

**5.** **පද්ධති හා පාලනය.**

**---------------------**

**පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.**

**(අ)** **කොන්ත්‍රාත් පරිපාලනය**

**(ආ)** **ආදායම් පරිපාලනය**

**(ඇ)** **වත්කම් කළමනාකරණය**

**(ඈ)** **ණයගැතියන් හා ණයහිමියෝ**